කැලෑ දෙපාර්තමේන්තු අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කැලෑ ආඥා පනතේ (451 අධිකාරිය) 64 වගන්තිය යටතේ සාදනු ලැබූ රෙගුලාසිවල අංක 10-ඊ දරන නියෝගය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව මාගේ විගණනය
සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්
අවධානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම්වේ. එම අවධානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාවය පිළිබඳව
මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණ ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

---------------------

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කැලෑ දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතුව තිබූ රු.1,143,608 ක දඩ මුදල් සමාලෝචිත වර්ෂයට ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) එක් එක් මාසය අවසානයේ වන අපරාධ සම්බන්ධයෙන් අධිකරණ වලදී විසඳී ඇති නඩු වලට අදාලව තැගි අරමුදලට බැර විය යුතු ආදායම් සම්බන්ධ තොරතුරු කලාප කාර්යාල වලින් ලබානොගෙන අධිකරණ 33 කින් සෘජුවම ලබා ගත් හිඟ ආදායම් පිළිබඳ වාර්ෂික වාර්තා පදනම් කර ගෙන උසාවි දඩ මුදල් හිඟ ආදායම් ගිණුම් ගත කර තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,282,541 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 14,946,455 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,663,914 ක අඩු වීමකි. අධිකරණ දඩ මුදල් ලැබීම් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.3,404,321 කින් අඩුවීම නිසා සමස්ත ලැබීම් සියයට 9 කින් අඩු වී තිබූ අතර තැගි ප්‍රදාන සමාලෝචිත වර්ෂයේදී රු. 1,081,661 කින් වැඩි වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය සියයට 31 කින් අඩු විය.

**3.2** **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අධිකරණ දඩ මුදල් වශයෙන් රු. 23,107.348 ක් ලැබී තිබුණු අතර එහි 2012 වර්ෂය වෙනුවෙන් ලැබුණු රු. 1,687,626 ක් ද ඇතුළත්ව තිබුණි. එම දඩ මුදලට 2013 වර්ෂය සඳහා ලැබිය යුතු රු. 2,587,299 ක මුදල ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු හා ලැබිය යුතු දඩ මුදල රු. 24,007,021 ක් විය. එය 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 9 ක පිරිහීමකි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්ය සාධනය

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) උසාවි මගින් අයකරගත් දඩ මුදල් කැලෑ අරමුදලට බැර කිරීමට ප්‍රමාදවීමක් සිදු වී තිබූ අතර වර්ෂය තුල එක් එක් මාසය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම් නිවැරදිව හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි.

(ආ) වන අපරාධ නඩු අවසන්ව ඇතත් එම වන අපරාධ වැලක්වීම සඳහා දායකවූ නිලධාරීන් විසින් ත්‍යාග මුදල් ඉල්ලුම් කිරීමේ හා ඉල්ලුම් කල ත්‍යාග මුදල් ලබාදීමේ ප්‍රමාදයන් වැලක්වීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

-----------------------

2013 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 5.2 අය වැය පාලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නීතිය ක්‍රියාත්මක කිරීමේහි යෙදී සිටින වන නිලධාරීන්ගේ එම කාර්යය අගයමින් ප්‍රතිලාභ ලබාදීම සඳහා පිහිටුවා ඇති අරමුදලෙන් ලබා දෙන ත්‍යාග මුදල් ප්‍රදානය වැය පාලනයක් කිරීම තුලින් පාලනය කල හැකි වියදමක් නොවුනද, ත්‍යාග ප්‍රදානවල ඇස්තමේන්තුවට සාපේක්ෂව ඉතිරි කිරීම්වලට හේතු වශයෙන් ක්‍රමාණුකූලව වැය පරිපාලනය යන්න දක්වා තිබුණි.

(ආ) උසාවි ගමන් වියදම් ඇස්තමේන්තුවට අනුව රු. 4,000,000 ක් වු අතර ඉන් සියයට 26 ක ඉතිරියක් නිරීක්ෂණය විය. 2012 වර්ෂයේදීද සියයට 31 ක ඉතිරියක් නිරීක්ෂණය වු අතර මෙම අවස්ථා දෙකෙහිම ඉතිරිවීම්වලට හේතු වශයෙන් ක්‍රමානුකූල වැය පරිපාලනය යන්න දක්වා තිබුණි.

**6.** **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වන සංරක්ෂක ජනරාල් වෙත වරින් වර දක්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් එකතු කිරීම
(ඈ) මුදල් ගිණුම්ගත කිරීම
(ඉ) හිඟ ආදායම් ගිණුම් ගත කිරීම